


# "හුදකලා පුණ්‍ය භූමිය" කච්චතීවු

සටහන හා ඡායාරූප: වරලත් වාස්තු විද්‍යාඥ සාගර ජයසිංහ

**ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ජාත්‍යන්තර මුහුදු සීමාවට මැදිව පිහිටා ඇති කච්චතීවු දූපතේ ශ්‍රී ලාංකීය උරුමය තහවුරු කිරීම සඳහා ප්‍රබල සාක්ෂියක් සැපවූයේ එහි පිහිටා ඇති එකම ස්ථිර ගොඩනැගිල්ල වූ කුඩා කතෝලික දේවස්ථානයයි.**




කච්චතීවු යනු ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සමුදුරින් පිහිටා ඇති මිනිස් වාසයෙන් තොර හුදකලා කුඩා දිවයිනකි. දෙරට අතර වරින් වර විවිධ දේශපාලන මත භේදයන්ට ලක්වන මෙම දූපත දකුණු ඉන්දියාවේ රාමේෂ්වරන් සිට කිලෝමීටර් 15ක් ඊසාන දිගින්ද, ශ්‍රී ලංකාවේ ඩෙල්ෆ්ට් දූපතේ සිට කිලෝමීටර් 14ක් පමණ නිරිත දිගින්ද පිහිටා ඇත. පරතෙරක් නොපෙනෙන මහා සාගරය මැද තනිව, කොරල්පරවලින් ගහන නොගැඹුරු රන්වන් වෙරළකින් වටව උතුරු මුහුදුකරයට ආවේණික ගස් වැල් වලින් පිරී ඇති මිනිස් ඇසුරින් කිලිටි නොවූ මෙම අලංකාර දිවයිනේ විශාලත්වය කිලෝමීටරයකට මදක් වැඩිය.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ජාත්‍යන්තර මුහුදු සීමාවට මැදිව පිහිටා ඇති කච්චතීවු දූපතේ ශ්‍රී ලාංකීය උරුමය තහවුරු කිරීම සඳහා ප්‍රබල සාක්ෂියක් සැපවූයේ එහි පිහිටා ඇති එකම ස්ථිර ගොඩනැගිල්ල වූ කුඩා කතෝලික දේවස්ථානයයි.

මත්ස්‍ය සම්පතින් බහුල වූ පාරම්පරික ධීවර "භූමියක" පිහිටි මෙම දිවයින, දෙරටේ ධීවරයින්ගේ අතරමැදි නවාතැන් පොළක් වුවත් එහි පළමුව ස්ථිර දේවස්ථානයක් තනන ලද්දේ මෙරටේ ධීවර ප්‍රජාව විසිනි. 1905දී පමණ ගොඩනගන ලදැයි සැලකෙන මෙම දේවස්ථානය සාම්ප්‍රදායික ධීවර ජනතාව අතර ඉමහත් භක්ත්‍යාදරයට ලක් වී ඇති ශුද්ධ වූ අන්තෝනි මුනිවරයාට කැපකර ඇති අතර එහි වාර්ෂික මංගල්‍යය පවත්වා ඇත්තේ යාපනය රදගුරු වසමේ පරිපාලනය හා සංවිධානය යටතේය. සම්ප්‍රදායික දේවස්ථානවල දැකගත හැකි වාස්තු විද්‍යාමත්මක ලක්ෂණවලින් පොහොසත් නොවූ උළු සෙවිලි වහලයකින් හා සුදු හුණු ගෑ බිත්ති හතරකින් සමන්විත මෙම





**මෙම සම්පදායික මංගල්‍යය සැමරීම සඳහා දෙරටේ ධීවර නඩයන් ඔවුන්ගේ එකම ප්‍රවාහන පිළිවෙළ වූ බෝට්ටුවල නැගී අවදානම් මෙන්ම ඉතා දුෂ්කර වූ වාර්ෂික 'වන්දනා' ගමනේ යෙදෙති.**



සරල ගොඩනැගිල්ල තුළ වූ අල්තාරය මත දෙරටේ කතෝලික ප්‍රජාවගේ අතිමහත් භක්තියට හා විශ්වාසයට බඳුන් වී ඇති ඓතිහාසික ශුද්ධ වූ අන්තෝනි මුණිඳුන්ගේ කුඩා ප්‍රතිමාව තැන්පත් කර ඇත. වර්ෂ 1974දී දෙරටේ රාජ්‍ය නායකයින් අතර ඇතිකර ගත් 'සුහද ද්වි පාර්ශ්වික' ගිවිසුමක් මගින් කච්චතීවු දූපතේ අයිතිය ශ්‍රී ලංකාවට පැවරුවත් ඉන්දියානුවන්ගේ පාරම්පරික ධීවර අයිතිවාසිකම් හා ආගමික නිදහස තහවුරු කර ඇති අතර අදද දහස් සංඛ්‍යාත ඉන්දියානු හා ශ්‍රී ලාංකික බැතිමතුන්ගේ සහභාගිත්වයෙන් එහි වාර්ෂික මංගල්‍යය පවත්වති.

මෙම සම්ප්‍රදායික මංගල්‍යය සැමරීම සඳහා දෙරටේ ධීවර නඩයන් ඔවුන්ගේ එකම ප්‍රවාහන පිළිවෙළ වූ බෝට්ටුවල නැගී අවදානම් මෙන්ම ඉතා දුෂ්කර වූ වාර්ෂික 'වන්දනා' ගමනේ යෙදෙති. ඉසව් දෙකක සිට එකම දිනයක මෙම හුදකලා පුණ්‍ය භූමිය වෙත ළඟාවන ඔවුන් ලන්තෑරුම් එළි සහිත තාවකාලික කූඩාරම්වල රාත්‍රිය පහන්කොට පසුදින එකම සංගමයක් ලෙස දිව්‍ය පූජාවට හා අනෙකුත් ආගමික භක්ති අභ්‍යාසයන්හි යෙදී එදිනම දෙරට බලා නැවත පිටව යන්නේ එයට උරුම වූ සුපුරුදු හුදකලාවට නැවත ඉඩදෙමිනි. සැබවින්ම මෙය අප දුටු දුර්ලභ දසුනක් වූ අතර එක්තරා විදියක සංවේදී ජනක අත්දැකීමකි.